# 6 අන්තර්ජාලයේ සැරිසරමු

මෙම ඒකකය හැදෑරීමෙන් ඔබට,

- සෙවුම් යන්ත්‍ර
- අන්තර්ජාලය භාවිතය සහ තොරතුරු ගවේෂණය
- වෙබ් අඩවි පිරිසැලසුම් කිරීම
- වෙබ් අඩවි සංවර්ධනය කිරීම

පිළිබඳ අවබෝධයක් ලැබෙනු ඇත.

## 6.1 සෙවුම් යන්ත්‍ර

අන්තර්ජාලයට පිවිසෙන ඔබට අවශ්‍ය දෑ (තොරතුරු, පින්තූර, වීඩියෝ ආදිය) සොයා ගැනීම සඳහා සෙවුම් යන්ත්‍ර භාවිත කළ හැකි ය (රූපය 6.1 බලන්න).

### ප්‍රධාන සෙවුම් යන්ත්‍ර කිහිපයක්





රූපය 6.1 - ප්‍රධාන සෙවුම් යන්ත්‍ර කිහිපයක්

# අන්තර්ජාලය භාවිතය සහ තොරතුරු ගවේෂණය

අන්තර්ජාල භාවිතයෙන් තොරතුරු ගවේෂණයේ දී නොයෙකුත් ක්‍රම භාවිත වේ. ඉන් කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

### සෙවුම් යන්ත්‍ර


වෙබ් අඩවි සොයා ගැනීම සඳහා සෙවුම් යන්ත්‍ර යොදා ගැනේ. මුල පදය (keyword) සෙවීම Search තීරයේ යතුරු ලියනය කිරීමෙන් ඒ හා සම්බන්ධිත වෙබ් අඩවි ලැයිස්තු ගත වේ.




### විවෘත කරන ලද වෙබ් පිටු ඉතිහාසය (History)

අන්තර්ජාල සෙවුම් යන්ත්‍ර මෑත කාලයේ දී විවෘත කරන ලද වෙබ් ලිපින ගබඩා කර ගනී.

අන්තර්ජාල ඉතිහාසය භාවිතයෙන් මෑත කාලයේ දී විවෘත කරන ලද වෙබ් අඩවි විවෘත කර ගත හැකි ය.




### පොත් සලකුණ Bookmark/ ප්‍රියතම වෙබ් අඩවි Favourite

බොහෝ විට භාවිත වන වෙබ් අඩවි පොත් සලකුණ/ප්‍රියතම මත ක්ලික් කිරීමෙන් තැන්පත් කර ගත හැකි ය.


මෙසේ තැන්පත් කරන ලද වෙබ් අඩවි ලැයිස්තුවක් ලෙස දර්ශනය වේ. එමගින් අවශ්‍ය වන වෙබ් අඩවිය තෝරා ගත හැකි ය.



## අධිසන්ධාන Hyperlinks

විවෘත වූ වෙබ් පිටුවක ඇති අධිසන්ධාන මගින් එම වෙබ් පිටුවේ ම වෙනත් ස්ථානයක් හා සම්බන්ධවීමට හෝ වෙනස් ම වෙබ් පිටුවක් හා සම්බන්ධ වීමට හෝ හැකි ය.


අධිසන්ධානයක් Hyperlink සහිත වාක්‍යයක් හෝ වචනයක් යටින් ඉරක් ඇඳ පාට යොදා ඇත. මූසිකය ඒ මතට ගෙනයාමේ දී අතක සලකුණක් දිස්වේ.





## ඉදිරියට, පිටුපසට Forward Backward

වෙබ් පිටු අතර ගවේෂණය කිරීමේ දී පෙර දී දර්ශනය වූ වෙබ් පිටුවට ආපසු යාමත් නැවත ඉදිරියට යාමත් මෙම බොත්තම් මගින් කළ හැකි ය.

වෙබ් පිටුවේ ඉහළ වම් කෙළවරෙහි මේවා දැකිය හැකි ය.




## පටිති Tabs



එක් සෙවුම් යන්ත්‍ර කවුළුවක් තුළට අවශ්‍ය වන වෙබ් පිටු රැසක් එකතු කර ගත හැකි ය. මේවා පටිති Tabs නම් වේ.

මෙසේ පටිති ආකාරයට වෙබ් පිටු විවෘත කර ගැනීමෙන් වෙබ් පිටු අතර මාරුවීම පහසු වේ.



ක්‍රියාකාරකම සඳහා වැඩපොතේ 6.1 බලන්න.

## 6.2 වෙබ් පිටුවක් නිර්මාණය කරමු

### නිර්මාණයට පෙර සැලකිල්ලට ගත යුතු කරුණු කිහිපයකි


1

- අවශ්‍යතාව කුමක් ද?
- භාවිත කරන්නෝ කවරහු ද?



2

- සැකසුම සහ ව්‍යුහය භාවිතයට පහසුවීම (Layout and structure)



3


- සැලැස්ම සහ මෝස්තරය (design)
- යොදා ගනු ලබන වර්ණ, අකුරු සහ අකුරුවල ප්‍රමාණය
- අඩංගු තොරතුරු කියවීමට පහසුවීම සහ පැහැදිලි බව



4

★ මං සෙවුම් (navigation)


- භාවිත කරන්නන් වෙබ් පිටුවෙහි සැරිසරන්නේ කෙසේ ද?
- වෙනත් වෙබ් පිටු සමග සම්බන්ධවීමට යොදා ගැනෙන මං සෙවුම් (navigation)




5

★ චිත්‍රක භාවිතය

- භාවිත කරන්නන්ට ගැළපීම
- අන්තර්ගතයට ගැළපීම
- අවම භාවිතය



## වෙබ් පිටු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන අංග

| මෙවලම - **Tool** | |
|---|---|
| වෙබ් පිටු නිර්මාණය සඳහා භාවිත කරනු ලබන වැඩතලය (platform) මෙවලම ලෙසින් හැඳින්වේ. මෙවලම් රාශියක් ඇති අතර ඉන් කිහිපයක් මෙහි දැක්වේ. |  |




| මෘදුකාංගය - **Software** | |
|---|---|
| HTML මෙවලම භාවිතයෙන් වෙබ් පිටු නිර්මාණය සඳහා යොදා ගත හැකි මෘදුකාංග කිහිපයක් | Notepad, NetBeans, Microsoft Visual Studio Community, Word Press, Bluefish, Eclipse |

### උසුලන - **Tags/Elements**

- වෙබ් පිටු නිර්මාණයේ දී උසුලන භාවිත කරනු ලබයි.
- උසුලනයක් සඳහා <> සලකුණු යොදනු ලැබේ.
- යොදා ගැනෙන මෙවලමට අනුව උසුලන වෙනස් වන්නේ ය.
- බොහෝ උසුලනයන්ට ආරම්භයක් මෙන් ම අවසානයක් ද ඇත.

HTML මෙවලම භාවිතයෙන් වෙබ් පිටු නිර්මාණයේ දී යොද ගනු ලබන උසුලන කිහිපයක් සහ ඒවායෙහි කාර්යයන්

| | |
|---|---|
| <html>…</html> | වෙබ් පිටුව නිර්මාණය සඳහා HTML මෙවලම භාවිතය සටහන් කිරීම |
| <head>…</head> | වෙබ් පිටු නාමය යෙදීම සඳහා සීමාව |
| <title>…</title> | වෙබ් පිටුවෙහි නාමය (පිටුව තුළ අන්තර්ගත නොවේ.) |
| <body>…</body> | වෙබ් පිටුවෙහි අන්තර්ගතය යෙදීම සඳහා සීමාව |
| <h>...</h> | මාතෘකා යෙදීම සඳහා |
| <b>…</b> | තද පැහැ ගැන්වීම |
| <i>…</i> | ඇල කිරීම |
| <centre>…</center> | පිටුවෙහි තිරස්ව මධ්‍යයනය කිරීම |
| <ul>…</ul> | බුලට් සලකුණු සහිත ලැයිස්තු ආරම්භ කිරීම |
| <ol>…</ol> | අංක සහිත ලැයිස්තු ආරම්භ කිරීම |
| <li>…</li> | බුලට්/අංක සහිතව ලැයිස්තු යෙදීමට |
| <br> | වාක්‍යයක අවසානය පෙන්වීම |
| <p> | ඡේදයක් ආරම්භ කිරීම |
| <img src="…."> | පින්තූරයක් ඇතුළත් කිරීම |
| <a herf="…">…</a> | අධි සන්ධානයක් hyperlink ඇති කිරීම |




ක්‍රියාකාරකම් සඳහා වැඩපොතේ 6.2, 6.3, 6.4, 6.5, 6.6 සහ 6.7 බලන්න.

## සාරාංශය

- අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු ගවේෂණය සඳහා සෙවුම් යන්ත්‍ර යොදා ගනු ලබයි.
- Google, Yahoo, bing, Ask, msn ආදිය එවැනි සෙවුම් යන්ත්‍ර කිහිපයකි.
- අන්තර්ජාල ඉතිහාසය, පොත් සලකුණු ආදිය ද තොරතුරු ගවේෂණය සඳහා උපකාරී වේ.
- අධිසන්ධාන, ඉදිරියට ආපස්සට, පටිති ආදිය වෙබ් පිටු අතර ගමන් කිරීම සඳහා භාවිත වේ.
- වෙබ් පිටුවක් නිර්මාණයේ දී එහි අවශ්‍යතාව, භාවිත කරන්නන්, එහි සැකසුම සහ ව්‍යුහය මෙන් ම භාවිත කරනු ලබන අංග පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.
- වෙබ් පිටු නිර්මාණයේ දී යොදා ගනු ලබන මෙවලම්, මෘදුකාංග සහ උසුලන වෙබ් පිටු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන අංග වේ.